**12-11-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ මෙම නාටකයේ ජවනිකාවන් දන්නවා. එමනිසා, ස්තූති කිරීම් අවශ්‍ය වන්නේ නැහැ.

**ප්‍රශ්නය:** ඉතාමත් හොඳින් සේවය කරනා දරුවන් තුළ කිසි විටෙකත් නොතිබිය යුතු පුරුද්ද කුමක් ද?

**පිළිතුර:** කිසිවිටකත් නොතිබිය යුතු පුරුද්ද ඉල්ලීමේ පුරුද්දයි. ඔබ පරමාත්ම පියාගෙන් ආශිර්වාද හෝ කරුණාව ඉල්ලිය යුතු නැහැ. කිසිම කෙනෙකුගෙන් මුදල් ඉල්ලන්න එපා. කිසියම් හෝ දෙයක් කෙනෙකුගෙන් ඉල්ලනවා වෙනුවට මැරෙන එක හොඳයි. ඔබ දන්නවා නාටකයට අනුව මීට පෙර කල්පයේ දී බීජයක් පැළ කළ අය නැවතත් එයම කරාවි. අනාගතයේ උසස් තත්ත්වයක් ලබා ගැනීමේ උවමනාවෙන් සිටිනා අය අනිවාර්යෙන් එය කරාවී; ඔවුන් අනිවාර්යෙන්ම සහයෝගශීලි වේවි. ඔබගේ රාජකාරිය සේවය කිරීමයි; ඔබ කිසිවෙකුගෙන් කිසිවක් නොඉල්ලිය යුතුයි. යම් යම් දේ ඉල්ලීමේ පුරුද්ද තිබෙන්නේ භක්ති මාර්ගයේදීයි. ඥාන මාර්ගයේදී නොවෙයි.

**ගීතය:** මට සහයෝගය දුන් ඒකායන තැනැත්තාට හදවත "ස්තූතියි" කියයි.

ඕම් ශාන්ති. පරම පියා, ගුරුවරයා හා සත්ගුරු වෙනුවෙන් - ස්තූතියි... කියා කියනා වචන දරුවන් වන ඔබගේ මුවින් පිට නොවිය යුතුයි. මන්ද මෙය කල් තබාම තීරණය වූ නාටකයක් බව දරුවන් වන ඔබලා දන්නවා. ස්තූතියි කියා කීම ප්‍රශ්නයක් නොවෙයි. දරුවන් වන ඔබලා නාටකයට අනුව මෙය තේරුම් ගෙන තිබෙනවා. නාටකය යන වචනයත් දරුවන් ඔබලාගේ සිහියට ඇතුළු වෙනවා. රඟ දැක්වීම යන වචනය කියූ සැනකින්ම මුළු රංග චරිතයම ඔබගේ සිහියට එනවා. එනම්, ජීව වන ඔබලා ස්වදර්ශනචක්‍රධාරීන් වෙනවා. ලෝක තුනම ඔබගේ සිහියේ තිබෙනවා: අශාරීරික ලෝකය, සූක්ෂම කලාපය හා ශාරීරික ලෝකය. එම රඟ දැක්වීම දැන් අවසානය කරා පැමිණෙමින් තිබෙනා බව ඔබලා දන්නවා. පරම පියා පැමිණ ඔබලා ත්‍රිකාලදර්ශි කරවනවා. ඔහු පැමිණ ඔබලාට කාලත්‍රය පිළිබඳ වූ ඥානයත්, ලෝක තුනත් ලෝකයේ මුල මැද හා අග පිළිබඳ රහසුත් කියා දෙනවා. කාලය හැඳින්නේනේ කාල් කියලයි. මේ දේවල් සටහන් කර ගැනීමකින් තොරව මතක තබා ගැනීමට බැරි වේවි. දරුවන් වන ඔබලා කරුණු රැසක්ම අමතක කරනවා. ඔබලා නාටකයේ කාල පරාසය දන්නවා. ඥානය නම් වූ තෙවෙනි ඇස ඔබට ලැබුණු විට පමණයි ඔබලා ත්‍රිනේත්‍රි හා ත්‍රිකාලදර්ශි වන්නේ. ඉතාමත් ප්‍රධානතම දේ වන්නේ ඔබලා දේවවාදීන් වීමයි. නැතිනම් ඔබලා සිටියේ අනාථයින් ලෙසයි. දරුවන් වන ඔබලා මෙම ඥානය ලබනවා. ශිෂ්‍යයින් තම බුද්ධියෙන් ඥානය අවර්ජනය කරනවා. මේකත් ඥානයයි. නාටකයට අනුව ඉහළම ඉහළ පරම පියා ඔබට ඥානය ලබා දෙනවා. නාටකය යන වචනය පිට වන්නේ ඔබලාගේ දෙතොලින් පමණයි. එහිදීත්, සේවා වැඩ කටයුතුවල නිරත වී සිටින්නන්ගෙන් පමණයි. තමන් සිටියේ අනාථයින් ලෙස කියා ඔබලා දැන් දන්නවා. දැන් ඔබලාට අසීමිත පරම පියා වන පාලකයාව මුණ ගැසී තිබෙනවා. ඔබලා අයිති එම අසීමිත ස්වාමියාටයි. පාලකයාටයි. මීට පෙර ඔබලා අසීමිතව අනාථයින්. අසීමිත පියා ඔබලාට අසීමත සතුටක් දෙනවා: වෙන කිසිම පියෙකුට එවන් සතුටක් දෙන්න බැහැ. දරුවන් වන ඔබලා තුළ නව ලෝකයත් පැරණි ලෝකයත් තිබෙනවා. කොහොමනමුත්, අන් අයට නිසි ලෙස පැහැදිලි කර දීමේ කාර්යයේ ඔබ තමාව කාර්යය බහුල කර ගත යුතුයි. සෑම කෙනෙකුටම ඒ ඒ අයට ආවේණික වූ සිදුවීම් තිබෙනවා. ස්මරණ වන්දනාවේ නිරතව සිටින්නන්ට පමණයි පැහැදිලි කර දිය හැක්කේ. ඔබට බලය ලැබෙන්නේ ස්මරණයෙනුයි. බලවත්ම අසිපත පරම පියායි. දරුවන් වන ඔබලා බලයෙන් තමාව පුරවා ගත යුතුයි. ඔබලා යෝගා බලයෙන් ලෝක ස්වාධිපත්‍යය හිමි කර ගන්නවා. ඔබට බලය ලැබෙන්නේ යෝගා බලයෙනි. ඥානයේ බලයෙන් නොවෙයි. ඥනය ඔබගේ ආදයම් මාර්ගය බව දරුවන් වන ඔබට පැහැදිලි කර කියා දී තිබෙනවා. යෝගා කියන්නේ බලයයි. දිවා රෑ වගේ වෙනසක් තිබෙනවා. යෝගා හොඳ ද? ඥානය හොඳ ද? යෝගාව ඉතාමත් ප්‍රසිද්ධයි. යෝගා යනු පරම පියාව සිහිපත් කිරීමයි. පරම පියා කියනවා: මෙම ස්මරණයේ සිටීමෙන් ඔබගේ පාප දුරු වී යනු ඇත. පියා වැඩිපුරම අවධාරණය කරන්නේ මේ ගැනයි. ඥානය ඉතාමත් පහසුයි. දෙවියන් කතා කරයි: මම ඔබලාට පහසු ඥානය ලබා දෙනවා. උපත් 84 චක්‍රයේ ඥානය මම ඔබලාට කියා දෙනවා. සියල්ල මේ තුළ අන්තර්ගතයි. ඒ ඉතිහාසය හා භූගෝලයයි. ඥානය හා යෝගාව එක් තත්පරයක දෙයක්. මම ජීවයක්. මම පරම පියාව සිහිපත් කළ යුතුයි. මෙයට උත්සාහය අවශයයි. ඔබ ස්මරණ

වන්දනාවේ නිරත වුණු විට, ඒක හරියට මුළු ශරීරයම අමතක කර දැමීමක් වගෙයි. එක පැයක්වත් අශාරීක තත්ත්වයේ ස්ථාවරව සිටිනවා නම් ඔබ ඉතාමත් පිරිසිදු කෙනෙක් වේවී. මිනිස්සු රෑ නින්දට ගිය විට පැය හයක අටක කාලයක් පුරා සම්පූර්ණ අශාරීරික තත්ත්වයට පත් වෙනවා. ඒ වෙලාවේ දී ඔවුන් පාපකාරී ක්‍රියා කරන්නේ නැහැ. ජීවය වෙහෙසට පත් වී නින්දට යනවා. ඔවුන්ගේ පාප දුරු වුණා නෙමෙයි. නැහැ: ඒ නින්දයි. එහිදී පාප කෙරෙන්නේ නැහැ. නිදා ගත්තේ නැතිනම් ඔවුන් දිගටම කරන්නේ පව් වැඩමයි. ඒ නිසා නිදා ගැනීමත් ආරක්ෂාවක්. මුළු දවස පුරාම වැඩ කර කර සිටි ජීව කියනවා: මම දැන් නින්දට ගොස් අශාරික වෙනවා. ශරීරය තුළ සිටිනා ගමන්ම ඔබ අශාරීරික විය යුතුයි. මම නම් වූ ජීවය මෙම ශරීරයෙන් මිදී සිටිමි. මම සාමයේ ප්‍රතිමූර්තියක්කි. ජීවය සත්‍යයි. ජීවමයයි. සාමයේ ප්‍රතිමූර්තියකි යන ගුණය ඔබ කවදාවත් අසා නැතුව ඇති. උත්තරීතර ජීවයේ ගුණය තමයි සත්‍යමයි. ජීවමයයි. ඔහු සාමයේ හා සතුටේ සාගරයයි. ඔබලාව හඳුන්වන්නේ මාස්ටර් වරුන් වශයෙන්: දරුවන් මාස්ටර්වරුනුයි. පරම පියා දිගින් දිගටම ඔබට ස්මරණයේ ක්‍රම විදි පෙන්වා දෙනවා. මුළු දවස පුරාම නිදා ගත යුතුයි කියා නැහැ. නැහැ. ස්මරණයේ නිරත වෙමින් ඔබ දැන් ඔබගේ පාප දුරු කර ගත යුතුයි. හැකි උපරිමයෙන් දිගටම පරම පියාව සිහිපත් කරන්න. පරම පියා ඔබට අනුකම්පා කර ආශිර්වාද දෙනවා කියා දෙයක් සිදු වන්නේ නැහැ. ඔහු කරුණාවන්ත අධිරාජ්‍යයයි කියා කීම හුදෙක් ඔහුගේ ප්‍රසංශාවක් පමණයි. තමෝප්‍රධාන් තත්ත්වයෙන් ඔබව සතෝප්‍රධාන් කරවීමත් ඔහුගේ චරිතයේ තිබෙන්නක්. භක්තිවන්තයින් ඔහුගේ ගුණ ගයනවා. නමුත් තව දුරටත් ඔබ එය කරන්නේ නැහැ. මෙන්න මේ නිසා තමයි දවසින් දවස ගීත නවත් වන්නේ. පාසල් වල ගීත ගායනා කර කරම ඉන්නවා ද? දරුවන් නිහඬව වාඩි වී සිටිනවා. ගුරුවරයා පැමිණි සැනකින් ඔවුන් අසුනින් නැඟිටිනවා. පසුව නැවතත් අසුන් ගන්නවා. පරම පියා කියනවා: මට ඔබට ඉගැන්වීමේ චරිතය දී තිබෙනවා. එම නිසා මා ඔබට ඉගැන් විය යුතුයි. දරුවන් වන ඔබලා නැඟිටින්න ඕනේ නැහැ. ජීව වන ඔබලා වාඩි වී ඇහුම්කන් දිය යුතුයි. ඔබගේ ක්‍රම විධි ලෝකයේ අයට වඩා සම්පූර්ණයෙන් වෙනස්. පියෙක් තම දරුවන්ට නැඟිටින්න කියා කියනවා ද? නැහැ. ඔබ එය කරන්නේ භක්ති මාර්ගයේදීය. මෙහිදී නොවෙයි. පියාම අසුනින් නැඟිට ඔබට නමස්තේ කියා කියනවා. ශිෂ්‍යයින් ප්‍රමාද වී පාසලට පැමිණෙනවා නම් පන්තියෙන් එළියේ සිට ගෙන සිටින්න කියා ගුරුවරයා ඔවුනට දඬුවම් දේවී. මෙන්න මේ නිසා තමයි ශිෂ්‍යයින් වේලාවට පැමිණීය නොහැකිවීම ගැන බය වෙන්නේ. මෙහි කිසිම බයක් නැහැ. පරම පියා දිගටම ඔබලාට මේවා පැහැදිලි කර කියා දෙන අතර ඔබලාත් දිගටම මේ මුරලි ලබනවා. ඔබ ඒවා නිතිපතා ඉගෙන ගත යුතුයි. නිතිපතා ඉගෙන ගත් විට, ඔබට පැමිණීමේ ලකුණු ලැබෙනවා. නැතිනම් ඔබට ලැබෙන්නේ නොපැමිණීමේ ලකුණුයි. පරම පියා කියනවා: මම ඔබටත් ඉතාමත් ගැඹුරු කරුණු කියා දෙනවා. මුරලියක් අතපසු වුණහොත් ඒ කරුණුත් ඔබට අතපසු වේවී. ලෝකයේ වෙන කිසිම කෙනෙක් නොදන්නා මේ කරුණු ඉතාමත් අලුත් කරුණුයි. ඔබගේ පින්තූර දුටු විට ඔවුන් පුදුමයට පත් වෙනවා. මේවා වෙන කිසිම ග්‍රන්ථයක සඳහන් නැහැ. මේ පින්තූර නිර්මාණය කළේ දෙවියනුයි. මේ ඔබගේ අලුත් කලාගාරයයි. දේවතාවරුන් බවට පත් වීමට සිටිනා බ්‍රහ්මින් වංශයේ බුද්ධීන් තුළ මේවා ධාරණය වනු ඇත. මේක හරි කියා ඔවුන් කියාවී. අපි මීට පෙර කල්පයේදීත් මේක ඉගෙන ගත්තා. එමනිසා අනිවාර්යයෙන්ම අපට උගන්වන්නේ දෙවියනුයි. භක්ති මාර්ගයේ අංක එකේ ග්‍රන්ථය ගීතාවයි. මන්ද පළමු ධර්මය මෙයයි. ඉන් ටික කාලයකට පසුව කල්ප භාගයකට පසුව තවත් ග්‍රන්ථ රාශියක් මතු වුණා. පළමුවෙන්ම ඒබ්‍රහම් ආවා. ඔහු සිටියේ තනිවමයි. ඒ තනි කෙනාගෙන් පසුව දෙදෙනෙක් බිහි වුණා. ඒ දෙදෙනාගෙන් හතර දෙනෙක් බිහි වුණා. ආගමක් 100,000 (ලක්ෂය) සිට 150,000 දක්වා වර්ධනය වුණු විට ග්‍රන්ථ නිර්මාණය වෙනවා. ආගමක් වර්ධනය වී ටික කලක් ගත වුණු විට තමයි ග්‍රන්ථ ලියැවෙන්නේ. නිවැරදි ගණනය කිරීමක් තිබෙනවා. දරුවන් වන ඔබලා තුළ ඉතාමත් ඉහළ සතුටක් තිබිය යුතුයි. අපි අපේ පරම පියාගෙන් අපගේ උරුමය දිනා ගන්නවා. මුළු ලෝක චක්‍රය ගැනම පියා දැන් අපට පැහැදිලි කර කියා දෙන බව ඔබලා දන්නවා. මේ අසීමිත ඉතිහාසය හා භූගෝලයයි. සැමට කියන්න: ඔබට මේ පැහැදිලි කර දෙන්නේ වෙන කිසිම කෙනෙක්ට කියා දිය නොහැකි ලෝකයේ ඉතිහාසය හා භූගෝලයයි. අන් අයට ලෝක සිතියමක් ඔබට පෙන්විය හැකි වුණත්, ලක්ෂ්මි හා නාරායන්ගේ රාජ්‍යයන් පැවතුණේ කවදාද? කොපමණ කාලයක් පුරා ද කියා ඔබට කියා දීමට වෙන කාටවත් හැකි වන්නේ නැහැ. තිබෙන්නේ එකම එක ලෝකයයි. ඔවුන් භාරතය පාලනය කළා. නමුත් තව දුරටත් ඔවුන් එහි නැහැ. මේ දේවල් වෙන කිසිම කෙනෙකුගේ සිහියේ නැහැ. චක්‍රයේ කාල පරසය වසර සිය දහස් ගණනක් කියා මිනිස්සු කියනවා. ඔබ ආදරණීය දරුවන්ට බාබා එච්චර කරදර කරන්නේ නැහැ. පියා කියන්නේ: ඔබ පාරිශුද්ධත්වයට පත් විය යුතුයි. පාරිශුද්ධ වීම සඳහා ඔබ භක්ති මාර්ගයේ සැහෙන කාලයක් රස්තියාදු වීම වෙමින් සිටියා. තමන් රස්තියාදු වීමට පටන් ගත්තේ මීට වසර 2500 කට පෙර සිට කියා ඔබලාට දැන් තේරෙනවා. බාබා දැන් නැවතත් වතාවක් පැමිණ සිටින්නේ ඔබට ඔබගේ අධිරාජ්‍යය නම් වූ වාසනාව

ලබා දීමටයි. ඔබට මේක මතකයි. ලෝකය අනිවාර්යයෙන්ම පරණ වෙනවා. අලුත් වෙනවා. අලුත් එක නැවතත් පරණ වෙනවා. එක අතකින් මිනිස්සු භාරතයේ ගුණ ගායනා කරනවා. අනිත් අතින් දිගටම භාරතයට නිග්‍රහ කරනවා. මේ ගීතය ඔබ ළඟම තිබෙනවා. දැන් සිදුවන්නේ කුමක්ද ඔබට පැහැදිලි කර කියා දිය හැකියි. මේ ගීත දෙකම මිනිස්සුන්ට ඇහෙන්න සලස්වන්න. රාමාගේ රාජ්‍යයත් මේ කාලයත් අතර ඇති වෙනස ඔබට පෙන්වා දිය හැකියි. පියා දුප්පතුන්ගේ ස්වාමියායි. බාබා ළඟට එන්නේ දුප්පතුන්ගේ දුවරුන් පමණයි. ධනවත් අයට ඒ ඒ අයගේ කුල්මත්බාවයන් තිබෙනවා. මීට පෙර කල්පයේ දී පැමිණි අය නැවතත් පැමිණේවී. ඒ ගැන වද වීමට අවශ්‍ය නැත. ශිව බාබා කිසිම දෙයක් සම්බන්ධයෙන් කරදර වන්නේ නැත. වද විය යුත්තේ දාදායි. අංක එකේ පාරිශුද්ධ ජීවය බවට පත් වීමේ කාර්යයත් ඔහුට කර ගැනීමට තිබෙනවා. මේ සඳහා අදෘශ්‍යමාන උත්සාහයක් අවශ්‍ය වෙනවා. වාර්තාව ලියන විට අහවල් කෙනාගේ වාර්තාව වඩාත් හොඳයි කියා ඔබට තේරුම් ගත හැකියි. පරම පියා සෑම විටම කියනවා: දිනපොතක් තබා ගන්න. දරුවන් කිහිප දෙනෙක්ම දින පොත ලියනවා. වාර්තාවක් තබා ගැනීමෙන් ඔබට හොඳින් වර්ධනය විය හැකියි. මේ ක්‍රමය ඉතාමත් හොඳයි. එමනිසා සෑම කෙනෙක්ම මෙය කළ යුතුයි. දිනපොතක් තබා ගැනීමෙන් ඔබට ලොකු යහපතක් සැලසේවී. දිනපොතක් තබා ගන්නවා යනු පියාව සිහිපත් කිරීමයි. තමන් කෙතරම් දුරට බාබාව පිහිපත් කළාද කියා ඔබ එහි ලිවිය යුතුයි. උත්සාහ දැරීම සඳහා ඒ දිනපොත ඔබට උදව් වේවී. ඔබලාට මේවා සටහන් කර ගැනීම සඳහා දිනපොත් සිය දහස් ගණනක් මුද්‍රණය කරවා තිබෙනවා. සටහන් කර ගත යුතු ප්‍රධානතම දේ මෙයයි. කවදාවත් මෙය අමතක නොකළ යුතුයි. හරියට වේලාවට ඔබ මෙය ඔබගේ දිනපොතේ සටහන් කර ගත යුතුයි. රෑට තමන්ගේ සම්පූර්ණ ගිණුම සටහන් කර ගත යුතුයි. උපත් ගණනාවක පාප තවමත් දුරු කර ගැනීමට තිබෙනා නිසා තමන් පාඩු විඳීමට යනවායි කියා එවිට ඔබට අවබෝධ කර ගත හැකි වේවී. පරමාත්ම පියා ඔබට මාර්ගය පෙන්වා දෙනවා. තමා කෙරෙහි අනුකම්පා සහගත වන්න. ගුරුවරයෙක් ඔබට උගන්වනවා. ඔහු ආශිර්වාද දෙන්නේ නැහැ. ආශිර්වාද හෝ කරුණාව ඉල්ලනවා වෙනුවට මැරෙන එක හොඳයි. ඔබ කිසිම කෙනෙකුගෙන් මුදල් නොඉල්ලිය යුතුයි. දරුවන් වන ඔබට මෙය තදින්ම තහනම් කර තිබෙනවා. පියා කියනවා: නාටකයට අනුව මීට පෙර කල්පයේදී බීජයක් පැළ කර තම උරුමය දිනා ගත් අය නැවතත් වතාවක් තමා විසින්ම එය ලබා ගනු ඇත. කිසිම දෙයකට ඔබ කිසිම කෙනෙකුගෙන් කිසිම දෙයක් නොඉල්ලිය යුතුයි. කෙනෙක් යමක් කළේ නැතිනම් ඔහුට ඉන් යමක් ලැබෙනා එකක් නැහැ. මිනිස්සු ගොඩක් දානමාන දී පින් දහම් කළ විට ඒ වෙනුවෙන් යමක් ලැබෙනවා. ඔවුන් රජ පවුලකට හෝ ධනවත් පවුලකට දාව උපදිනවා. යමක් කිරීමේ අවශ්‍යතාවය තිබෙනා අය තමන් විසින්ම එය කරනවා. කිසිම කෙනෙකුගෙන් ඇසීමේ අවශ්‍යතාවයක් නැත. මීට පෙර කල්පයේ දී ඔවුන් කළේ කුමක්ද ඒ දෙයම කිරීමට නාටකය ඔවුන් උනන්දු කරවනු ඇත. කිසිම දෙයක් ඇසීමට අවශ්‍ය නැත. සේවය සඳහා ඔබගේ නිධාන ගබඩාව දිගටම පිරෙමින් පවතින බව බාබා ඔබට කියනවා. මම මගේ දරුවන්ට සල්ලි දෙන්න කියා කියන්නේ නැහැ. භක්ති මාර්ගයේ දේවල් ඥාන මාර්ගයේ දී තිබිය නොහැකියි. මීට පෙර කල්පයේ දී උදව් කළ අය ඒ ආකාරයෙන්ම මේ කල්පයේදීත් කරනු ඇත. ඔබ කිසිම දෙයක් නොඉල්ලිය යුතුයි. බාබා කියනවා: දරුවනි, ආධාර එකතු කිරීමට මෙහිදී ඔබට අවසරයක් නැහැ. එවන් දේ කරන්නේ සන්‍යාසීවරුනුයි. භක්ති මාර්ගයේ දී මිනිසුන් දෙන කුඩා දෙය වෙනුවෙනුත් ඔවුනට එක උපතකට එහි ඵලය ලැබෙනවා. මෙහිදී උපතක් උපතක් පාසාම ඔබට ඵල ලැබෙනවා. එමනිසා, උපතක් උපතක් පාසා යමක් ලැබීමට නම් මෙම උපතේදීම සියල්ල දානය කිරීම කළ යුතුයි. ඔහුගේ නම නිදන් ගබඩාවේ අහිංසක ස්වාමියා යන්නයි. උත්සාහ දරන්න. එවිට ඔබට ජයග්‍රාහී මල් දාමයේ රැඳිය හැකි වනු ඇත. නිධන් ගබඩා පිරෙන විට සියලු දුක් සහ වේදනාවන් ඉවත් වී යනු ඇත. එහි දී ඔබ අකල් මරණ වලට ලක් වන්නේ නැත. මෙහි මිනිස්සු මරණයට බයයි. යමක් සිදු වූ සැනකින්ම ඔවුන්ට සිහිපත් වන්නේ මරණයයි. එහිදී නම් ඔබට එවන් සිතිවලි පහල වන්නේ නැහැ. මන්ද එය අමරණීයත්වයේ දේශයයි. මෙය මරණයේ අපිරිසිදු දේශයයි. භාරතය තිබුණේ අමරණීය දේශය වශයෙනුයි. දැන් එය මරණීය දේශය බවට පත් වෙලා. අවසන් කල්ප භාගය ඔබලාට ඉතාමත් අපිරිසිදු කාලයකි. ඔබලා දිගටම පහළට වැටෙමින් පැමිණියා. ජගත්නාත් දේවාලයේ අපිරිසිදු පින්තූර රැසක් තිබෙනවා. බ්‍රහ්ම බාබාට හොඳට අත්දැකීම් තිබෙනවා. ඔහු හැම තැනකම ඇවිදලා තිබෙනවා. ලස්සන ඔහු අවලස්සන වෙලා. ඔහු ජීවත්ව සිටියේ කුඩා ගම්මානයකයි. ඇත්තෙන්ම කියනවා නම් මුළු භාරතයම පොඩි ගම්මානයක්: ඔබලා ගැමි කොල්ලන්. තමන් දැන් ලෝක පාලකයින් බවට පත් වෙනවා. ඔබට තේරෙනවා. තමන් දැන් බොම්බේ වැසියන් කියා සිතන්න එපා. දිව්‍ය ලෝකය හා සංසන්දනය කරනා කල බොම්බේ කුමක්ද? වැඩකට නැතිම දෙයක්. පාෂාණයක් තරම්වත් වටින්නේ නැහැ. අනාථයන් බවට පත් වුණු ගැමි කොල්ලන් දැන් දිව්‍ය ලෝක පාලකවරුන් බවට පත් වෙනවා. එමනිසා, එම සතුට තිබිය යුතුයි. එහි නම ම දිව්‍ය ලෝකය යන්නයි. මාළිගා

සියල්ල දියමන්ති හා මුතු මැණික් රැසක් ඔබ්බවා සෑදුවක්. සෝමනාත් දේවාලය පවා දියමන්ති හා මුතු මැණික් ඔබ්බවා සෑදූ එකකි. පළමුවෙන්ම ඔවුන් ශිවා වෙනුවෙන් දේවාලයක් සෑදුවා. ඔවුන් ඒ කාලයේ ඉතාමත් ධනවත්. දැන් භාරතය ඉතාමත් කුඩා ගමක්. සත් යුගය තිබුණු කල එය සෞභාග්‍යයමත්ව තිබුණා. ඔබ හැරෙන්න ලෝකයේ සිටිනා වෙන කිසිම කෙනෙක්ට මේ දේවල් අවබෝධ වන්නෙ නැහැ. ඔබ කියන්නේ: ඊයේ අපි අධිරාජ්‍යයවරුන් විය. අද අප හිඟන්නන්ය. දැන් නැවතත් වතාවක් අප ලෝක පාලකවරුන් බවට පත් වෙනවා. තම වාසනාව ගැන ගුණ ගයමින් ඔබ ස්තූති පූර්වක විය යුතුයි. අපි කෝටි ප්‍රොකෝටි වාරයක් ධනවත් අයයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පාප කිරීමෙන් ආරක්ෂා වීම සඳහා, ශරීරය තුළ සිටිනා ගමන්ම අශාරීරික වීමට උත්සාහ දරන්න. ඔබගේ ශරීරය අමතකම වී යන ආකාරයෙන් ස්මරණ වන්දනාවේ නිරත වන්න.
2. ඥානය ආවර්ජනය කර දේවවාදීන් බවට පත් වන්න. කවදාවත් මුරලියක් අතපසු නොකරන්න. වර්ධනය වීම සඳහා ඔබගේ දිනපොතේ ස්මරණ වාර්තාව වාර්තා කර ගන්න.

**වරදානය:** සෑම ක්‍රියාවකදීම අධ්‍යාත්මික බලය භාවිතා කිරීමෙන් ඔබ යුක්තියුක්ත (ප්‍රඥාවෙන් පිරී) සහ ජීවන්මුක්ත (ජීවිතයෙන් නිදහස්) වේවා.

මෙම බ්‍රාහ්මණ ජීවිතයේ විශේෂත්වය වන්නේ අධ්‍යාත්මිකත්වයයි. ඔබට ඔබව සහ අන් අයව පරිවර්තනය කළ හැක්කේ අධ්‍යාත්මිකත්වයේ බලයෙන් පමණි. මෙම බලයෙන් ඔබට බොහෝ භෞතික බන්ධන වලින් විමුක්තිය ලැබේ. කෙසේවෙතත්, යුක්තියුක්ත වීමට සහ සෑම ක්‍රියාවකදීම ලිහිල් වීමට වඩා, අධ්‍යාත්මික බලය භාවිතා කරන්න. ඔබේ සිතිවිලි, වචන සහ ක්‍රියාවන්හි එකවර අධ්‍යාත්මිකත්වයේ බලය අත්විඳින්න. අංශ තුනෙන්ම යුක්තියුක්ත අය ජීවන්මුක්ත (ජීවිතයෙන් නිදහස්) බවට පත්වේ.

**පාඨය:** සත්‍යයේ විශේෂත්වයෙන්, සතුට සහ බලය අත්විඳීම දිගටම කරගෙන යන්න.

***** ඕම් ශාන්ති *****

**අශාරීරික ස්ථිතියේ පුහුණුව වැඩි කරන්න(අශාරීරි සහ විදේහි).**

කුමන තත්ත්වයන් පැමිණියත්, පැමිණීමට නියමිතව තිබුණත්, ඒ සඳහා අශාරීරික ස්ථිතියේ බොහෝ පුහුණුවීම් අවශ්‍ය වේ. එමනිසා, අනෙක් සියල්ල පසෙකට දමා, “සමහර විට මෙය සිදුවනු ඇත, සමහර විට එය සිදුවනු ඇත, කුමක් සිදුවේද?” යනුවෙන් සිතීම පවා නවත්වන්න. දැන් අශාරීරික ස්ථිතියේ පුහුණුව වැඩි කරන්න. කිසිදු තත්ත්වයක් හෝ කිසිදු ආකාරයක කැලඹීමක් අශාරීරික ස්ථිතියේ සිටින දරුවන්ට බලපෑම් කළ නොහැක.